www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ මැතිවරන: සමාජවාදී සමානතා පක්ෂයට ඡන්දය දෙන්න

## Sri Lankan election: Vote for the Socialist Equality Party

**සමාජවාදී සමානතා පක්ෂය විසිනි**
**2009 පෙබරවාරි 13**

පෙබරවාරි 14 දින පලාත් සභා මැතිවරනවල දී සිය අපේක්ෂකයන්ට ඡන්දය දෙන ලෙස සමාජවාදී සමානතා පක්ෂය (සසප) වැඩකරන ජනතාවගෙන් ඉල්ලා සිටියි. සසපට දෙන ඡන්දය වනාහි ආන්ඩුවේ වර්ගවාදී යුද්ධය ද ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා ජීවන තත්වයන් මත එල්ල කෙරෙන ප්‍රහාරයන් ද අවසන් කිරීමේ සමාජවාදී ක්‍රියාමාර්ගයක් සඳහා දෙන ඡන්දයකි.

මධ්‍යම පලාතේ නුවරඑලිය දිස්ත්‍රික්කයට ද වයඹ පලාතේ පුත්තලම දිස්ත්‍රික්කයට ද අපේක්ෂකයන් 19 දෙනා බැගින් කන්ඩායම් දෙකක් සසප ඉදිරිපත් කරයි. නුවරඑලිය කන්ඩායම මයිල්වාගනම් දේවරාජාගේ නායකත්වයෙන් ද පුත්තලම කන්ඩායම නිහාල් ගීකියනගේ ගේ නායකත්වයෙන් ද තරග වදියි. දෙදෙනාම දිගු කාලීන සසප සාමාජිකයන් වන අතර දෙමල, සිංහල හා මුස්ලිම් යන සියලු කම්කරුවන්ගේ පන්ති අවශ්‍යතාවන් හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීමේ ලා දශක ගනනාවක අත්දැකීම් ඔවුන් සතුව ඇත.

මැතිවරනය තුල ජනාධිපති මහින්ද රාජපක්ෂ හා ඔහුගේ ආන්ඩුව විසින් යලි අරඹනු ලැබ උත්සන්න කෙරුනු සාපරාධී යුද්ධය ප්‍රමුඛත්වයට පත්ව තිබේ. බෙදුම්වාදී එල්ටීටීඊයට එරෙහි රාජපක්ෂගේ ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ'' ප්‍රතිඵල වශයෙන් 25 වසරක ගැටුමේ අන් කවර කලෙකටත් වඩා වැඩි මරන, විනාශයන් හා පීඩාවන් ඇතිකර තිබේ. ප්‍රධාන විරුද්ධ පක්ෂ දෙක වන දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාප) හා සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) යුද්ධයට පූර්න පිටුබලය සපයයි.

දිවයිනේ උතුරෙන් හා නැගෙනහිරෙන් වහාම හා කොන්දේසි විරහිතව ශ්‍රී ලංකා හමුදාවන් ඉවත් කිරීම සඳහා සසප අපේක්ෂකයෝ පෙනී සිටිති. මෙම ඉල්ලීම මුල්කොට ගැනීමේදී සසප එල්ටීටීඊයට හෝ වෙනම ඊලම් ධනේශ්වර රාජ්‍ය කැබැල්ලක් සඳහා එහි ඉල්ලීමට හෝ කිසිදු දේශපාලන සහයෝගයක් නොදක්වයි. අප උත්සාහ කරන්නේ සමාජවාදී ප්‍රතිපත්ති මත පදනම්වූ කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා කම්කරු පන්තිය හා පීඩිත ජනතාවන් පොදු අරගලයක් තුල ඒකාබද්ධ කිරීම සඳහා ය.

එක් දිවයිනක් තුල සමාජවාදය සාක්ෂාත් කල නොහැකි යයි සසප අවධාරනය කරයි. කොලඹ ආන්ඩුවට හා හාම්පුතුන්ට එරෙහි ඕනෑම අරගලයක් නොවැලැක්විය හැකි පරිදිම බලගතු ජාත්‍යන්තර බලවේගයන්ට මුහුන දෙනු ඇත. රාජපක්ෂගේ යුද්ධය පිටුපස අධිරාජ්‍යවාදී අනුග්‍රාහකයන්, සියල්ලන්ටමත් වඩා එක්සත් ජනපදය, ලැග සිටියි. ඒ අතරතුර ශ්‍රී ලංකාවේ කම්කරුවන් ජාත්‍යන්තර කම්කරු පන්තියේ කොටසක් වන අතර ආසියාවේ හා ලොව පුරා කම්කරුවන් මෙන්ම එකම යෝධ ගෝලීය සමාගම් විසින් සූරාකනු ලබයි.

සසප, හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ සිය සහෝදර පක්ෂ සමඟ එක්ව දකුනු ආසියාවේ හා ලෝකයේ සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකාවේ හා ඊලම්හි සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා සටන් වදින්නේ එබැවිනි.

ජනාධිපති රාජපක්ෂ හා ඔහුගේ එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) එල්ටීටීඊයට එරෙහිව ඔවුන් ලබාගත් මිලිටරි ජයග්‍රහන මත සුවිශේෂිතව පාදක වෙමින් දේශපාලනය ගෙන යති. යුද්ධයේ අවසානය සෞභාග්‍යයේ හා ප්‍රජාතන්ත්‍රවාදයේ නව යුගයක් උදා කිරීමට මග පාදනු ඇතැයි යන ඔහුගේ පොරොන්දු ප්‍රෝඩාවකි. හැට වසරක් තිස්සේ කොලඹ බලයට පත්වූ සෑම ආන්ඩුවක්ම කම්කරු පන්තිය බෙදීමට හා තමන්ගේ සහාය සඳහා සමාජ පදනමක් ගොඩනගා ගැනීමට දෙමල විරෝධී ස්වෝත්තමවාදය අවුලුවා ඇත. ප්‍රමුඛව ම, යුද්ධයට මගපාදනු ලැබුවේ එයයි.

පෙබරවාරි 10 දින මහනුවරදී කථාකරමින් රාජපක්ෂ ඔහුගේ අභිප්‍රායන් පිලිබඳව මෙසේ ඉඟි කලේය. ''මේක නිකම්ම මැතිවරනයක් නොවෙයි. අපේ රන විරුවන් ශක්තිමත් කරන මැතිවරනයක්. අපේ රටේ සමහරු රන විරුවන්ගේ මාවත අවහිර කරන්න උගුල් අටවනවා. වයඹ හා මධ්‍යම පලාත් සභා මැතිවරනවල අපේ ජයග්‍රහනය අපව ශක්තිමත් කරන බව කියන්නේ ඒනිසයි.''

පුරසාරම් පිටුපසින් රාජපක්ෂ මූලික සත්‍යයක් වෙතට ඇඟිල්ල දිගු කරයි: ඒ දස දහස් ගනන් ජීවිතවල වියදමින් ගෙන ආ හමුදාවේ ජයග්‍රහන මගින් කොලඹ දේශපාලන සංස්ථාපිතයේ අතිශයින්ම යුදවාදී හා

ප්‍රතිගාමී කොටස්වල තත්වය ශක්තිමත් කරනු ලබන බවය. සිය විරුද්ධවාදීන්ට, සියල්ලටත් වඩා කම්කරු පන්තියට, එරෙහි ප්‍රහාර උත්සන්න කිරීමට මේ මගින් ඔවුන් දිරිමත් වනු ඇත.

මුලතිව් දිස්ත්‍රික්කය තුල රුදුරු ලෙස ගෙන යන ආන්ඩුවේ යුද්ධය අනතුරු ඇඟවීමක් ලෙස ගත යුතුය. 250000ක් ලෙස ගනන් බලා ඇති සිවිල් ජනතාවක් ද සමඟ එල්ටීටීඊය කුඩා භූමිභාගයක් තුලට කොටුකර, හමුදාව සිය අවි බලය යොදා ගන්නේ එහි ප්‍රතිවිපාක සාපරාධී ලෙස නොතකා හරිමිනි. සිය ගනනක් ජනතාව මරාදමා තවත් දහස් ගනනකට තුවාල සිදුකර ඇත. දිවිගලවා ගැනීමෙන් පසුව ''මුදාගත්'' ජනතාව දැවැන්ත ''ශුභසාධන ගම්මානවලට,'' එනම් යථාර්තයේදී හමුදාව විසින් රැකවල් ලූ රැඳවුම් කඳවුරු තුලට, ගාල්කිරීමේ සැලසුම් දැන් සූදානම් කර තිබේ.

දැනටමත් ''මුදාගත්'' නැගෙනහිර, ආරක්ෂක හමුදා ද කුප්‍රකට තමිල් මක්කල් විදුතලෙයි පුලිහල් (ටීඑම්වීපී) නම් පැරා-මිලිටරි කල්ලියක නායකයා හා ආන්ඩුවේ සගයෙකු වන මහ ඇමති පිල්ලෙයාන් ද විසින් ප්‍රධානත්වය දැරෙන සුවිශාල මිලිටරි කඳවුරක් බවට පරිවර්තනය කර තිබේ. එවන් පියවර අනෙකුත් තැන්වලද ක්‍රියාවට නගනු ඇත.

යුද්ධයේ වියදම් දැරීම සඳහා රාජ්‍යය මුලුමනින්ම පාහේ බංකොලොත් කර ඇති රාජපක්ෂ, 1930 ගනන්වලින් පසුව ඇතිවූ දරුනුම ගෝලීය ආර්ථික අර්බුදයට මුහුන දී සිටියි. පැරනි නය ගෙවාගත නොහැකිවත් අලුතින් නය ලබාගත නොහැකිවත් ආන්ඩුව මුහුන දෙන්නේ ලඹ දෙන විදේශ විනිමය අර්බුදයකටය. භාන්ඩ මිල හා අපනයන ආදායම් කඩා වැටෙමින් තිබේ. විදේශ ආයෝජකයෝ පලායති.

කම්කරු පන්තියට යුද්ධය බලපා ඇත්තේ, මිල ඉහල යාම, ඉහල බදු මෙන්ම සහනාධාර, රජයේ රැකියා, අධ්‍යාපනය, සෞඛ්‍ය හා ශුභසාධන සේවා රුදුරු ලෙස කපාහැරීම් වශයෙනි. ගෝලීය සුනාමිය දිවයිනේ ආර්ථිකය වසාගන්නා තතු හමුවේ පුපුරන සුලු දේශපාලන ප්‍රතිවිපාක පිලිබඳව පාලක පැලැන්තිය තුල ඇත්තේ ගැඹුරු භීතියකි.

ආන්ඩුව ප්‍රතිචාර දනවන්නේ කෙසේදැයි රාපක්ෂ දැනටමත් ප්‍රකාශයට පත්කොට තිබේ. වැඩ වර්ජනය කරන කම්කරුවන්, විරෝධතා දක්වන ගොවීන් හා සිසුන් යුද ව්‍යායාමයට හරස් කපන්නේ යයි නැවත නැවතත් හෙලා දැක තිබෙන ඔහු ඔවුන්ට එරෙහිව තම පුලුල් හදිසි අවස්ථා බලතල යොදාගන්නා බවට තර්ජනය කරයි. ආන්ඩුව දැනටමත් ක්‍රියා කරමින් සිටින්නේ තෝරාගත් ඇමතිවරුන්ගේ, ජෙනරාල්වරුන්ගේ, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ හා හෙංචයියන්ගේ කල්ලියක් ලෙසය. ඔවුන් තමන්ව සලකා ගන්නේ පාර්ලිමේන්තුවට, නීතියට හා ව්‍යවස්ථාවට ඉහලින් සිටින අය ලෙසය. ඔවුහු විරුද්ධවාදීන් නිහඬ කිරීම සඳහා තර්ජනය, පහරදීම් හා ඝාතක කල්ලි මත පදනම් වෙති.

එජාප හා ජවිපෙ යන ප්‍රධාන විරුද්ධ පක්ෂ දෙකම රාජපක්ෂගේ යුද්ධයෙහි සාපරාධී හවුල්කරුවන්ව සිටිති. 2002 සටන් විරාමය අත්සන් තැබූ හා එල්ටීටීඊය සමඟ සාම සාකච්ඡාවලට මුලපිරූ එජාපය, දැන් කියා සිටින්නේ සමස්ත ක්‍රියාවලියම යුද්ධය අලුතින් ඇරඹීමට හමුදාවට අවස්ථාව ලබාදුන් ශූර උපායකට වැඩි දෙයක් නොවන බවය. එජාප නායක රනිල් වික්‍රමසිංහ සිය දේශ මාමකත්වය තහවුරු කිරීමට උත්සාහ කරමින් නිකුත් කල නිවේදනයක් ''ආරක්ෂක හමුදාවන්ට එහි යුධ ජයග්‍රහන වෙනුවෙන් ආචාර පුදකල'' අතර ''මෙම හමුදා ක්‍රියාන්විතයන් ඉදිරියට ගෙන යාම අධීක්ෂනය කිරීම වෙනුවෙන්'' ආන්ඩුවට ද ප්‍රශංසා කලේය.

2002 සටන් විරාමයට එරෙහිව ස්වෝත්තමවාදී උද්ඝෝෂනයක යෙදුනු ජවිපෙ යුද්ධය යලි ඇරඹීම කරා රාජපක්ෂ තල්ලු කිරීමේ ගෞරවයට හිමිකම් පාමින් යුද්ධයේ ප්‍රතිවිපාකයන්ගේ වගකීම බෙදා ගනිති. සිය වැටුප් හා සේවා තත්වයන් ආරක්ෂාකර ගැනීමේ අරගලවලට පිවිසි කම්කරුවන්ගේ ව්‍යාපාරය කඩාකප්පල් කිරීමේ වගකීම ද පැවරෙන්නේ ජවිපෙ මතය. එකකින් පසුව තවෙකක් වශයෙන් පැනනැගුනු වැඩ වර්ජන වලටඑරෙහිව ආන්ඩුව, කම්කරුවන් යුද ව්‍යායාමයට බාධාකරන්නේයයි චෝදනා කල සෑම විටම ජවිපෙ නායකයෝ මුලුගැන්වුනහ.

පිරිහෙන ජීවන තත්වයන් මුල් කර ගෙන වැඩෙන මහජන කෝපය ගැන සාවධාන වන ජවිපෙ, දූෂනය හා නාස්තිය ගැන දරුනු ලෙස ආන්ඩුව හෙලා දකිමින් විරෝධතා ව්‍යාපාරයක් ආරම්භ කර තිබේ. ඒ හරියට ඇමතිවරු කිහිප දෙනෙක් ඉවත්කලහොත් හා වරප්‍රසාද අවසන් කලහොත් ගෝලීය ධනේශ්වර අර්බුදය හා සියවස් කාලක යුද්ධය මගින් නිර්මානය කර තිබෙන ඉමහත් ආර්ථික ගැටලු විසඳිය හැකිවාක් මෙනි.

නව සමසමාජ පක්ෂය (නසසප) හා එක්සත් සමාජවාදී පක්ෂය (එසප) යන මධ්‍යම පන්තික රැඩිකල් කන්ඩායම් ද අපේක්ෂකයන් ඉදිරිපත් කොට තිබේ. පසුගිය දශක තුන පුරා නසසප හා ඉන් බිඳී ගිය එසප දේශපාලන සංස්ථාපිතය සඳහා ආරක්ෂක කපාටයක් ලෙස ක්‍රියාකරමින් ධනේශ්වර පක්ෂ පිලිබඳ මිත්‍යාවන් ප්‍රචාරය කල අතර ඔවුහු සියල්ලටත් වඩා කම්කරු පන්තියේ කුමන හෝ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ඇතිවීම වැලැක්වූහ.

මෙම මැතිවරන ව්‍යාපාරයේ දී, නසසප හා එසප, ශ්‍රී ලංකාවේ ධනේශ්වරයේ ප්‍රථම පක්ෂය වන දක්ෂිනාංශික එජාප සමග සන්ධානයක් තනාගෙන, ද්‍රෝහිත්වයේ නව ගැඹුරකට කිඳා බැසි තිබේ. අත්‍යසමාන දේශපාලන

බඩපිනුම් මාලාවක් ගසමින්, මෙම අවස්ථාවාදීන් කියාපාන්නේ, 1983 දී යුද්ධය දියත් කලා වූත් අතීතයේ දී ප්‍රජාතන්ත්‍ර අයිතීන් උල්ලංඝනය හා රාජ්‍ය මර්දනය සම්බන්ධයෙන් කුප්‍රකට වූත් එජාපය “අත්තනෝමතික” රාජපක්ෂ ආන්ඩුවට සන්සන්දනාත්මකව “අඩු නපුර” නියෝජනය කරන බවයි.

නසසප හා එසප පිලිවෙත්වල පවත්නා එකම අඛන්ඩතාව වන්නේ, “ජාත්‍යන්තර සාම ක්‍රියාදාමයට” එනම්, ආන්ඩුව හා එල්ටීටීඊය අතර අධිරාජ්‍යවාදීන්ගේ අනුග්‍රහයෙන් පැවැත්වෙන සාම සාකච්ඡාවලට, සහයෝගය දැක්වීමයි. ඔවුන් එසේ කරන්නේ, එම සියලු සාම ප්‍රවර්ධකයන් -- එක්සත් ජනපදය, ජපානය, යුරෝපා සංගමය සහ නෝර්වේ -- රාජපක්ෂගේ යුද්ධයට විවෘතව හෝ අවෘතව පිටුබලය සපයයි යන කාරනාව ද නොතකමිනි. තතු එසේ වුව ද මෙම ප්‍රෝඩාකාරී “සාම ක්‍රියාදාමය” පුනර්ජීවනය කිරීමට මහ බලවතුන්ට බලපෑම් දමන ලෙස එජාපයට දිගටම ආයාචනා කිරීමෙන් නසසප හා එසප නැවතී නැත.

කම්කරු පන්තිය බැරෑරුම් අන්තරායන්ට මුහුන දී සිටී. බොහෝ ඡන්දදායකයන් හඟින්නේ, ආන්ඩුවෙන් හා එහි සාපරාධී යුද්ධයෙන් පමනක් නොව, සමස්ත දේශපාලන සංස්ථාපිතයෙන් ම තමන් විරසකව සහ එය සම්බන්ධයෙන් විශ්වාසභංගව සිටින බවයි. කෙසේවෙතත්, මෙම මනෝගතීන්, කම්කරු පන්තියේ අවශ්‍යතා ඉදිරියට ගෙනයාමෙහිලා ප්‍රමානවත් නොවේ.

සසප මැතිවරනයට තරග වදින්නේ, යුද්ධයට හා සමාජ අසමානතාවට සමාජවාදී විකල්පයක් ඉදිරිපත් කිරීමට ය. යුද්ධයේ හා ආර්ථික අර්බුදයේ මූල හේතුව වන ධනපති ලාභ ගරන පද්ධතියට එරෙහිව ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් තුල කමකරු පන්තිය හා ගම්බද ජනතාව බලමුලුගන්වනු සඳහා අපි සටන් වදිමු.

අපගේ වේදිකාවේ ප්‍රථම මුරගල වන්නේ ජාත්‍යන්තරවාදයයි. ශ්‍රී ලංකා සංස්ථාපිතයේ සිංහල අධිපතිවාදය හා එල්ටීටීඊයේ දෙමල බෙදුම්වාදය ඇතුලු, සෑම රූපාකාරයක ම ජාතිකවාදය හා වර්ගෝත්තමවාදය ප්‍රතික්ෂේප කරන ලෙස සසප වැඩ කරන ජනතාවගෙන් ඉල්ලා සිටී. සියල්ලන්ගේ ම පොදු පන්ති අවශ්‍යතා වෙනුවෙන් ඒකාබද්ධ අරගලයක් ගෙන යා හැකි වන්නේ.     ඔවුන්ගේ ආගම, ජනවර්ගය හා භාෂාව නොතකා, සියලු කම්කරුවන් ඒකාබද්ධ කිරීම මගින් පමනි,

උතුරේ හා නැගෙනහිර මිලිටරි වාඩිලෑම වහාම අවසන් කරන ලෙස ඉල්ලා සිටීම මගින් සුලුතර දෙමල ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීම ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියේ අතිමූලක යුතුකමකි. දශක ගනනාවක වෙනස්කම් කිරීමේ උරුමය පෙරලා දමා ධනවාදයට එරෙහිව පොදු අරගලයක් සඳහා පදනම තහවුරු කර ගැනීමේ ප්‍රථම පියවර මෙයයි. ශ්‍රී ලංකාවේ හා ඊලම්හි සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා අරගලය, දශක ගනනාවක් තිස්සේ වර්ගවාදී හා ජනවාර්ගික ගැටුම්වලින් ඔඩුදුවා ඇති ඉන්දියානු උප-මහාද්වීපය පුරා ප්‍රතිරාව දෙනු ඇත.

ලාභ ගරන ක්‍රමයට එරෙහි ප්‍රහාරයක් සඳහා පූර්ව-අවශ්‍යතාව වන්නේ, පාලක පන්තියේ සියලු පක්ෂවලින්, කල්ලිවලින් හා කන්ඩායම්වලින් කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වයයි. ශ්‍රී ලංකාවේ ඉතිහාසය පාලක පන්තියේ “ප්‍රගතිශීලී” යයි කියනු ලබන කන්ඩායම්වලට කම්කරු පන්තිය යටත් කිරීමෙන් උපන් ඛේදවාචකවලින් පිරී තිබේ. වත්මන් තත්වයට තුඩු දුන් මූලයන් බොහෝ සෙයින්, ලසසප සමාජවාදී ජාත්‍යන්තරවාදයේ ක්‍රියාමාර්ගය අතහැර දමා 1964 දී ධනේශ්වර බන්ඩාරනායක ආන්ඩුවට ඇතුලුවීම තුලින් සොයා ගත හැකිය.

ආර්ථික පසුගාමිත්වයේ, නය බරෙහි හා දරිද්‍රතාවයේ ගිලී සිටින පරිපීඩිත ගම්බද ජනතාව තමන්ගේ පැත්තට දිනාගැනීමට කම්කරු පන්තිය සමත් වන්නේ, ස්වාධීනව බලමුලුගැන්වී කම්කරු-ගොවි ආන්ඩුවක් සඳහා වන ඉදිරිදර්ශනය වෙනුවෙන් සටන් වැදීමෙන් පමනි. එවන් ඉදිරිදර්ශනයක් ඉල්ලා සිටින්නේ, ධනවත් අතලොස්සකගේ පුද්ගලික ලාභ අවශ්‍යතා නොව බහුතරයක සමාජ අවශ්‍යතා සපුරාලනු වස් සමාජය ඉහල සිට පහලට මුලුමනින් ම ප්‍රතිනිර්මානය කිරීමේ අරගලයකට නොඅඩු දෙයකි.

මෙම අරගලයට නායකත්වය දීමට සසපට අද්විතීය සුදුසුකමක් ඇත. ලසසපයේ පාවාදීමට එරෙහිව 1968 දී එය පිහිටුවන ලද අවස්ථාවේ පටන් මේ දක්වා, සසප ද එහි පූර්වගාමියා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය ද සෑම රූපාකාරයක ම ජාතිකවාදී, වර්ගෝත්තමවාදී හා අවස්ථාවාදී දේශපාලනයට එරෙහිව, සමාජවාදී ජාත්‍යන්තරවාදයේ, එනම් ට්‍රොට්ස්කිවාදයේ මූලධර්ම සඳහා ධෛර්‍ය සම්පන්න හා දිග්ගැසුනු අරගලයක් ගෙන ගොස් තිබේ. යුද්ධයේ ආරම්භයේ ම පටන් එයට අඛන්ඩව විරුද්ධ වූ ශ්‍රී ලංකාව තුල එකම පක්ෂය විකොස/සසපයි.

යුද්ධයට හා සමාජ අසමානතාවට සමාජවාදී විකල්පයක් වෙනුවෙන් සිය ඡන්දය පාවිච්චි කරන ලෙස කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් සසප ඉල්ලා සිටී. එමෙන් ම අප ඔබගෙන් උදක්ම ඉල්ලා සිටින්නේ, හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ජාත්‍යන්තර ප්‍රකාශනය වන ලෝක සමාජවාදී වෙබ් අඩවිය තුල දිනපතා ඉදිරිපත් කරනු ලබන අපගේ ක්‍රියාමාර්ගය හා ඉදිරිදර්ශනය අධ්‍යයනය කොට, සසපට බැඳී කම්කරු පන්තියේ මහජන විප්ලවවාදී පක්ෂය ලෙස එය ගොඩනැගීමට එක්වන ලෙසයි. □

© www.wsws.org